**ගල්නෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කන්දේගම, මුස්නව හා නාගල්ගමුව ජල ව්‍යාපෘතිවල ජල සම්බන්ධතා 436 ක සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.1,357,478 ක් ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉහත ජල ව්‍යාපෘතිවලින් තවදුරටත් අයවිය යුතු හිඟ ජල සම්බන්ධතා ගාස්තු රු.1,543,026 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් හා හිඟ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතු වේ. | ජල ව්‍යාපෘතියට අදාල ආදායම් වියදම් තැන්පත් ගිණුමක සටහන් කර ශේෂය ඉදිරියට ගෙන ඇත. |
| (ii) | බුල්නෑව පොළ භූමිය කඩ කාමර බවට පත් කිරීම සඳහා සතිපොළ බදුකරුවන්ගෙන් ලබාගෙන තිබුණු රු.3,461,000 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර වර්ෂයේ එම ණය මුදලින් කඩ කාමර කුලී ලෙස වාර්ෂිකව අයකරගත යුතු රු.53,900 ක මුදල සමුච්චිත අරමුදල් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි. | සභාව විසින් ලබාගත් ණය හා වර්ෂයට අදාල ආදායම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | බුල්නෑව පොළ භූමිය කඩ කාමර බවට පත් කිරීම සඳහා සතිපොළ බදුකරුවන් 16 ක ගෙන් රු.4,800,000 ලබාගත් අතර එයින් රු.800,000 ක් කඩ කාමර තැන්පතු ලෙස ඉදිරියට ගෙන ඇත. ඉතිරි මුදල යොදා 2018 වර්ෂයේදී කඩකාමර ඉදිකිරීම සඳහා රු.4,181,746 ක පිරිවැයක් දරන ලදී. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 සිට 04 ක දක්වා වූ කාලයක සිට පැවත එන රු.1,756,222 ක් වූ ලැබිය යුතු ණයගැති වටිනාකම අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| වසර 02 සිට 35 දක්වා කාලයක සිට පැවත එන රු.1,634,728 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉකුත් තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.293,733 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය | වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උපවගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මෝටර් ප්‍රවාහන පනත 203 අධිකාරිය 2(1) වගන්තිය | පිරිවැය රු.500,000 ක් වූ, ටේලර් 02 ක් ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි. | ලියාපදිංචි නොකළ වාහන ලියාපදිංචිය සඳහා අවශ්‍ය කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,242,950 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,360,892 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,104,200 | 2,297,020 | 2,385,270 | 897,300 | 2,090,000 | 2,299,870 | 2,290,370 | 985,550 |
| (ii) | කුලී | 2,152,300 | 2,152,300 | 1,998,556 | 725,895 | 1,084,900 | 1,164,300 | 1,041,770 | 572,151 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 600,000 | 351,000 | 402,850 | 203,575 | 400,000 | 529,900 | 512,600 | 255,425 |
| (iv) | වෙනත් ආදායම් | 8,709,390 | 12,603,020 | 11,753,514 | 10,494,090 | 8,135,000 | 10,451,375 | 7,000,000 | 9,644,584 |
| | | 13,565,890 | 17,403,340 | 16,540,190 | 12,320,860 | 11,709,900 | 14,445,445 | 10,844,740 | 11,457,710 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණුකළ | දියුණු කල ප්‍රදේශ ගැසට් කර වරිපනම් ආදායම් රැස්කර | දියුණුකළ ප්‍රදේශයක් ලෙස නම් කිරීමට අදාලව මායිම් පිළිබඳ උපලේඛන සකස් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදේශ ගැසට් කර වරිපනම් බදු පනවා නොතිබුණි. | ගැනීමට කටයුතු කල යුතුවේ. | උපදෙස් ලබාදී ඇති අතර කඩිනමින් අදාල වරිපනම් බදු පැනවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 601 කින් අයවිය යුතු හිඟ කසල බදු රු.581,250 ක් අයකර ගෙන නොතිබුණි. | කසල බදු අයකර ගැනීමට කටයුතු කලයුතු වේ. | අදාල හිඟ කසළ බදු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

2.2.3 කුලී
----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගල්නෑව වෙළඳ සංකීර්ණයේ කඩකාමර ඒකක 20 කින් අයවිය යුතු හිඟ කඩකාමර කුලී රු.298,078 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කඩකුලී ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.4 බලපත්‍ර ගාස්තු
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 112 කින් අයවිය යුතු හිඟ ව්‍යාපාර බදු රු.122,250 ක් හා ඒකක 113 කින් අයවිය යුතු බලපත්‍ර ගාස්තු ආදායම් රු.93,400 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදාල බලපත්‍ර ගාස්තු අයකර ගනිමින් ඇත. |

2.2.5 කර්මාන්ත බලපත්‍ර
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ඒකක 28 කින් වසර 01 ක් 02 ත් අතර කාලයක සිට අයවිය යුතු හිඟ කර්මාන්ත බදු රු.39,000 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කර්මාන්ත බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදාල හිඟ කර්මාන්ත බදු නිසි පරිදි අයකර ගැනීමට කටයුතු යොදා ඇත. |

2.2.6 ටෙන්ඩර් බදු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 2001 සිට 2018 දක්වා ඒකක 20 කින් අයවියයුතු හිඟ ටෙන්ඩර් බදු රු.334,317 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ටෙන්ඩර් බදු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදාල ටෙන්ඩර් බදු මුදල් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. |

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.10,129,240 හා මුද්දර ගාස්තු රු. 364,850 ක් විය. | ප්‍රධාන ලේකම් හා අනෙකුත් නිලධාරීන්ගෙන් අදාල මුදල් ලබාගැනීමට කටයුතු කල යුතු වේ. | අදාල උසාවි දඩමුදලින් රු.7,500,000 ක මුදලක් අප වෙත අයකර ගෙන ඇත. මුද්දර ගාස්තු වටිනාකම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම්කර ඇතත් මේවන තෙක් නිදහස් කර නැත. |

03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන කාරණා 28 අදාලව සම්මත අතුරු ව්‍යවස්ථා රහිත කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | සභාව විසින් මෙතෙක් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නැති නමුත් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවැති ක්‍රියාකාරකම් වලට අදාලව උපක්‍රියාකාරකම් 16 ක් ඉටු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ කාරණා වර්ෂය තුල ඉටුකිරීමට කටයුතු කල යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මට අදාළව ඉටු නොකර තිබූ උප ක්‍රියාකාරකම් 2020 වර්ෂයේදී ඉටුකිරීමට සැලසුම් කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිහිටුවා ක්‍රියාත්මක කළයුතු වේ. | 2020 අයවැය ලේඛනය මගින් තිරසර සංවර්ධන ඉලක්ක සපිරීමට අදාල නිර්ණායක මත පදනම්ව කාර්යයන් පෙළ ගස්වා ඊට අදාල ප්‍රතිපාදන වෙන්කර ඇත. |

3.2 වත්කම් කළමනාකරණය

3.2.1 පවරානොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතා කරනු ලබන රු.6,390,000 ක් වටිනා කැබ් රථය සහ රු.250,000 ක් වටිනා ට්‍රැක්ටර් බවුසරය පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර ගණනාවක සිට පැවත එන එකතුව රු.2,042,323 ක් වටිනා යන්ත්‍ර උපකරණ අයිතම 36 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාකර තිබුණි. | භාවිතයට ගතහැකි වත්කම් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හා අනෙක් වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගල්නෑව සහ නෑගම්පහ මහජන පුස්තකාලවල රු.55,588 ක්වූ පොත් 592 ක් අස්ථානගතවී තිබුණි. | අස්ථානගත වූ පොත්වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව අය කිරීමට කටයුතු යොදා ඇත. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව 2019 ජනවාරි 21 දින අභ්‍යන්තර විගණන නිලධාරියකු පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා වාර්තා නිකුත් කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොමැත. |